# නර්තනය  - 10 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

# හෝමාගම අධ්‍යාපන කලාපය
# ස්වයං අධ්‍යයන ඉගෙනුම් අත්වැල
# නර්තනය - 10 ශ්‍රේණිය

**නිපුණතාව 2.0**

**ක්‍රියාකාරකම 2.2.1 : අලංකාර පද ගොඩ නගමු.**

## අලංකාර පද නිර්මාණය

- සම්ප්‍රදායික නර්තන පද කොටස් වලට එම සම්ප්‍රදායට අයත් අනන්‍යතා ලක්ෂණ ඇති පද කොටස් ඇතුලත් කොට නිර්මාණය කරගන්නා පද අලංකාර පද වේ.
- විවිධ තාලරූප අනුව මෙම අලංකාර පද කොටස් නිර්මාණය කිරීමෙන් නර්තනයක ඒකාකාරී බව නැති වී අලංකාරයක් මෙන්ම ප්‍රේක්ෂක ආකර්ෂණයද ලබාගත හැකි වනු ඇත.

6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා ඔබ උගත් ගොඩ සරඹ භාවිතයට ගනිමින් එම පද කොටස් වලට සාම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ පද උපයෝගී කොටගෙන පද නිර්මාණ කරගත හැකිය.වන්නම් නර්තන, ගැමි නැටුම්, සාම්ප්‍රදායික නර්තන වල අලංකාර පද නර්තනය ආදී පද කොටස් යොදා ගත හැකි වේ.

අලංකාර පද නිර්මාණයේදී,

- තාලරූප, සාම්ප්‍රදායික ලක්ෂණ, හැඩතල, චලන වල සැහැල්ලු හා වේගවත් බව, දිශා භාවිතය, තල භාවිතය, කැරකීම්, පැනීම්, සුරල් පද සම්මිශ්‍රණය කිරීම ආදී කරුණු පිළිබඳ අවධානය යොමු කල යුතු ය.
- මාත්‍රා 2+4 තාලය සැවුලා වන්නම හා මාත්‍රා 4 තනි තිතේ තාලය සිංහරාජ වන්නම සඳහා ඉහත කරුණු සැලකිල්ලට ගෙන අලංකාර මාත්‍රාපද නිර්මාණය කරගත හැකිය.

## කාර්ය පත්‍රිකාව

1.,මහ තනි තිතට අලංකාර පද දෙකක් නිර්මාණය කරන්න.

2.සුළු මහ දෙතිතට (2+4) අලංකාර පද දෙකක් නිර්මාණය කරන්න.

3.එම බෙර පද දෙක ප්‍රස්තාර කරන්න.

4.වන්නම් දෙකෙහි තානම ගායනය කරමින් ඔබ නිර්මාණය කළ අලංකාර පද නර්තනය කරන්න.